ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2014

NIOSH

National Institute of Occupational Safety and Health • Sri Lanka

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**ගරු ගාමිණී ලොකුගේ**

අමාත්‍යතුමා - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**ගරු සරත් වීරසේකර**

නියෝජ්‍ය අමාත්‍ය - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**ඩබ්ලිව්.ජේ.එල්.යූ. විජයවීර**

ලේකම්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**වෛද්‍ය එන්.සී. [illegible]මරසිංහ**

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**විගණන කමිටුව**

**වෛද්‍ය එන්.සී.[illegible]මරසිංහ** - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**සී.සේනානායක -** සභාපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව

**ඩබ්ලිව්.ඩී.බී.ජේ. වැලිවත්ත** - නිරීක්ෂක, විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව

**ඊ.ඩබ්ලිව්.ඒ.ජී.පුන්‍යසිරි** - අභ්‍යන්තර විගණක, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**පී.එම්.කේ.පෙරේරා** - සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**බැංකුව-** මහජන බැංකුව - නාරාහේන්පිට

# සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ(සෞඛ්‍ය හා සුවස්ථතා)
අධ්‍යක්ෂ(සුරක්ෂිත තා)
සහකාර අධ්‍යක්ෂ (සෞඛ්‍ය)
සහකාර අධ්‍යක්ෂ (ස්වස්ථතා)
සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරි
වෘත්තීය සුරක්ෂිතතා නිළධාරි
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ (සිවිල්)
සහකාර අධ්‍යක්ෂ කාර්මික
සහකාර අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රිකල් හා ඉලෙක්ට්‍රොනික්)
නීති සම්පාදක නිළධාරි
පුස්තකාලාධිපති
සම්බන්ධීකරණ නිලධාරි
කලමණාකරණ සහකාර තාක්ෂණිකා (2)
රියදුරු(2)
කාර්යාල සහයක (3)
කලමණාකරණ සහකාර තාක්ෂණික නොවන (8)



**<u>කම්කරු හා කම්කරු සබඳතා මාත්‍යතුමාගේ පණිවිඩය</u>**

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය, ජාතික අවශ්‍යතාවයක් ලෙස මහින්ද චින්තන ප්‍රතිපත්ති මත පදනම් වූ අනාගත දැක්ම තුලින් අවධාරණය කෙරෙන කරුණක් නම් සියළු දෙනාටම සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට මහ එලිපෙහෙලි කරන පරිසරයක් නිර්මාණය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් පවත්වා ගැනීමයි.

එබැවින් මේ සඳහා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් එම කාර්ය ඉටු කිරීමට තීරණය කර ඇත.මේ සඳහා සේවා යෝජකයන් සහ කලමණාකරණය අවධානම් අඩු වැඩ බිමක් නිර්මාණය කිරීමට සහ අවධානම් රහිත කලාපයක් ඇති කිරීමටද වගබලාගත යුතුය. කම්කරුවන් ඒ පිලිබඳ දැනුවත් කිරීමේ වගකීම සහ ඔවුන්ව ආරක්ෂා කිරීමද ඔවුන්ගේ කටයුත්තකි.

මේ සඳහාවූ වගකීම කම්කරුවන්ට පමණක් නොපැවරේ. රජයටද මේ හා සමාන වගකීමක් පැවරෙන අතර ඒ සඳහා වූ යටිතල පහසුකම් කටයුත සම්පාදනය කිරීමද රජයට පැවරී තිබෙන කාර්යයකි. නීති ප්‍රතිපත්ති හරහාද මෙම ක්‍රියාවලියට දායක විය හැකිය. මේ සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සහ සුදුසු ක්‍රමයක් ඇති කරමින් වෘත්තීය කටයුතු තුලදී සේවකයන්ගේ ආරක්ෂාව තහවුරු කල හැකිය.

සේවා යෝජකයන්ට පමණක් මේ හා ලබාදෙන වගකීම පැවරෙනවා යන්න මින් අදහස් නොවන අතර ඒ හා සමාන වූ වගකීමක් රජයටද පැවරේ. මෙම ක්ෂේත්‍රය පිලිබඳ දැනුමක් සහිත පිරිස්වල ද වගකීමක් වන්නේ කම්කරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයෙහි කාර්යභාරය වී ඇත්තේ වැඩ කරන ජනතාවගේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ඉහළ නැන්වීම සඳහා සේවක හා සේව්‍ය පක්ෂයන් දැනුවත් කිරීම තුලින් ඔවුන්ගේ සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීමයි.

මේ සියළුම ප්‍රයත්නයන් සාර්ථක කර ගැනීමට කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරලීමට මූලිකත්වය සැපයූ අමාත්‍යාංශය සහ ආයතනයේ කාර්ය මණ්ඩලයටද මෙහිදී කෘතඥ වෙමි.මෙම කාර්යයන්හිදී මා හා එක් වූ ත්‍රෛයිපාර්ශවීය කොටස්කරුවන් වූ සේව්‍ය, සේවක නියෝජනයන්ටද, රාජ්‍ය ආයතන, අන්තර් ජාතික කම්කරු සංවිධානය හා රාජ්‍ය නොවන සංවිධානවලටත්, මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට සියළු දිරිගැන්වීම් හා ශක්තිය ලබාදුන් මාගේ සහෝදර මැති ඇමතිවරුන්ටද මාගේ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

**ගාමිණී ලොකුගේ**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය



**<u>කම්කරු හා කම්කරු සබඳතා □මාත්‍යාංශ ලේකම්,</u>**
**<u>ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ සභාපති තුමාගේ</u>**
**<u>පණිවිඩය</u>**

2015 වර්ෂයේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශ අයවැය පිලිබඳ කාරක සභා අවස්ථා විවාදයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා පිලියෙල කරන ලද මෙම අමාත්‍යාංශය යටතට අයත් වු ආයතනක් වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයයේ 2014 වර්ෂයේ දී ලබාගත් ප්‍රගතිය පිලිබඳ වාර්තාව මෙම ප්‍රකාශනය මහින් ඔබ අතට පත් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය තුලින් නිරෝගී සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහිකරගැනීම සඳහා ආයතනය තුල යහපත් වැඩ පරිසර තත්වයක් ඇතිකරලීමේ අරමුණින් යුක්තව පසුගිය වසරේදි කැපවීමෙන් ක්‍රියාකර තිබේ. සියළු ආකාරයේ වෘත්තීය අනතුරු වැලැක්වීමට අවශ්‍ය අධ්‍යාපනය පුහුණුව හා දැනුවත් කිරීම වැනි කාර්යයන් තුලින් නව වෘත්තීය සුරක්ෂිතතා සංස්කෘතියක් බිහිකිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය පසුගිය වසර කිහිපය තුල ඉටුකළ මෙහෙවර ප්‍රසංශනීයයි. මෙම සියළු කාර්යයන් තුලින් අප ආයතනය රටේ ඵලදායිතාවය වර්ධනය කිරීමේ කර්තව්‍යයට දායකත්වයක් සපයා තිබේ.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වූ නායකත්වය නිවැරදි මාර්ගෝපදේශකත්වය සහ අනුග්‍රහය ලබාදුන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිඳුන්ටත් මාගේ ගෞරව පූර්වක කෘතඥතාවය ප්‍රකාශ කර සිටිමි.

එමෙන්ම මෙම කාර්යය සාධනය අත්කර ගැනීමට කැපවීමෙන් සහ සහයෝගයෙන් කටයුතු කළ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඇතුළු සියළු ආයතන ප්‍රධානීන්ටත් එම ආයතනනවල සියළු කාර්යය මණ්ඩල නිළධාරින්ටත් මාගේ ස්තුතිය පුදකර සිටිමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙවරක් ඉටුකළ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හාසෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියළුම කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

**ඩබ්ලිව්. ජේ.එල්.යූ. විජයවීර**
ලේකම්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**<u>ජාතිකවෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ පණිවුඩය</u>**



වෘත්තීය සුරක්ෂිතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ ඉලක්කය වූ කලී ස්වයං මූල්‍ය සම්පාදිත ආයතනයක් වශයෙන් අපක්ෂපාතීව ජාත්‍යන්තර මට්ටමින් වෘත්තීය සුරක්ෂිතාව හා සෞඛ්‍ය සේවා සැලසීම හා ආරක්ෂාකාරී වූත් සෞඛ්‍යයට හිතකර වැඩ පරිසරයක් ශ්‍රී ලංකාව තුල නිර්මාණය කිරීම සහ ආරක්ෂිත සංස්කෘතියක් ශ්‍රී ලංකාව තුල ඇති කිරීමය.

ඒ අනුව අපගේ දැක්ම වන්නේ සියළු දෙනාටම වෘත්තීය සුරක්ෂිතතාව මෙන්ම සුභසාධනය සැලසීම වන අතර අපගේ මෙහෙවර වනුයේ අධ්‍යනය, පුහුණුව පර්යේෂණ සහ අනෙකුත් අදාළ මැදිහත් වීම් තුලින් වැඩ පරිශ්‍රය තුල සිදුවන්නා වූ සියළු ආකාරයේ අනතුරු වැළැක්වීමත් වැඩබිම් තුල කම්කරුවන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය හා ශුභසාධනය සහතික කිරීමයි.

අද වැනි දිනක වෘත්තීය සුරක්ෂිතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය විසින් සාඩම්බරයෙන් සහ නෛකශ්‍රීන් තම පළමුවැනි තොරතුරු සංග්‍රහය එළි දක්වනු ලැබ තිබේ.

අපගේ අනුග්‍රාහක හවතුන් වෙත ජාතික වෘත්තිය සුරක්ෂිතාව හා සෞඛ්‍ය පිළිබඳ බෙදාහැරීමෙහිලා මෙය අතිශය ආකර්ෂණීය ප්‍රවේශයක් බව අප සලකමු.

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ නවතම තොරතුරු කර්මාන්තයට සැපයීම අපගේ අපේක්ෂාව වන අතර තොරතුරු සහ දැනුම බෙදාහදා ගැනීමෙහිලා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ අපගේ පාර්ශවකරුවන් අතර මෙය නියත වශයෙන් පාලමක් වනු ඇත.

ශ්‍රී ලංකාව තුල ආරක්ෂාකාරී සංස්කෘතියක් බිහිකිරීමෙහිලා වගකිවයුතු ආයතනයක් ලෙස වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය ක්‍රියා කරයි. අපගේ සියළු ක්‍රියාකාරකම් සහ සේවා ඉතා විශිෂ්ඨ ආකාරයෙන් පවත්වා ගැනීමට ක්‍රියා කරනු ලබන අතර අපගේ සේවාවන් සැලසීමේදී අප විසින් ප්‍රශස්ථ විද්‍යාත්මක පරිචය ප්‍රශස්ථ විද්‍යාත්මක දැනුම හා සම්පත් ප්‍රයෝජනයට ගන්නෙමු. ශ්‍රී ලාංකික කර්මාන්ත ක්ෂේත්‍රයේ අනාගතය ගැන සැලකිලිමත් වෙමින් වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සේවාවක් විශිෂ්ඨ අයුරින් අප විසින් සලසනු ලබන අතර දේශීය හා අන්තර්ජාතික කර්මාන්තය තුල භාවිත ප්‍රශස්ථ පරිචයන් මෙම තොරතුරු සංග්‍රහය තුලින් ඔබ අතට පත් කෙරේ.

අප සංවිධානය වූ කලී රජය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ හවුල්කාරිත්වයක් ගොඩනැගෙනු වස් නිරතුරුවම අතහිත දෙන එකකි. දේශීය කර්මාන්තය සේවා යෝජකයින් සේවා නියුක්තිකයින්, ජාත්‍යන්තර සංවිධාන, විශ්ව විද්‍යාල මෙන්ම වෘත්තිකයින් සමඟ ගෝලීය සංකල්ප අනුව යමින් ඔවුන් සමඟ හවුල්කාරත්වය සමායෝජනය කරමින් සහ කම්කරු අමාත්‍යාංශය නියෝජනය කරමින් කටයුතු කරන එකම රජයේ ආයතනය අප වේ. තවද සේවා යෝජකයින් , සේවා නියුක්තිකයින් සහ සෙසු සියළු

පාර්ශවකරුවන් සමඟ කටයුතු කරමින් අපගේ ත්‍රෛපාර්ශවීය ආයතන සමග සබඳතා අප විසින් පවත්වාගෙන යමින් සිටිමු.

වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය සමග අත්වැල් බැඳ ගනිමින් අප සමඟ පවතින හවුල්කාරීත්වය ශක්තිමත් කර ගැනීමට අප හා එක්වන ලෙස ඔබට ආරාධනය කරමි.

අපගේ සේවාවන් සඳහා ප්‍රවේශ වීම ඉතා පහසුය. අපගේ අගනා හවුල්කරුවන් වෙනුවෙන් සාධාරණ හා අපක්ෂපාතී සේවාවක් අප විසින් පවත්වාගෙන යනු ලැබේ. අපගේ  වෙබ් අඩවිය හරහා වෘත්තීය සුරක්ෂිතතාව හා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඕනෑම අයෙකුට ලබා ගත හැකිය. අපගේ සහාය ලබා ගැනීමට අපේක්ෂා කරන ඕනෑම කර්මාන්තයකට අපගේ තොරතුරු සංග්‍රහය මඟින් ප්‍රවේශයක් සලසාගත හැකිය.

අප විසින් සලසනු ලබන ඕනෑම සේවාවක් සම්බන්ධයෙන් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය සැම විටම වග වේ. අපගේ වැඩසටහන් ජාත්‍යන්තර හා දේශීය වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ප්‍රමිතීන්ට අනුව ඇගයෙන අතර, වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආශ්‍රිත ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් අප විසින් ප්‍රශස්ථ විසඳුම් ලබා දෙනු ලබන අතර අපගේ තොරතුරු  සංග්‍රහය මඟින් කර්මාන්තයේ අඛණ්ඩ ප්‍රවර්ධනය වෙනුවෙන් අප ප්‍රශස්ථ වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍යය ගැටළු සඳහා පිලියම් යෙදීමේ පාර්ශවකරුවන් වී සිටින්නනෙමු.

වෘත්තීමය අනතුරු  හා තුවාල සම්බන්ධයෙන් ගත්කල ඊට අදාලව පවත්නා නව තාක්ෂණය සමඟ කටයුතු කිරීමේදී වැඩෙහි නිරත වීමේදී ඇතිවන තුවාල වලට ප්‍රධානතම හේතුව වන්නේ මනුෂ්‍යයන් අතින් සිදුවන වැරදිය. එබැවින් ශ්‍රම බලකාය තුල කාර්මික ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබඳ සංස්කෘතියක් නිර්මාණය කිරීම පිණිස ආරක්ෂාව, සෞඛ්‍ය හා වෘත්තීමය රෝග  පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීම ඉතා වැදගත් ය. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ඉහළ කළමණාකාරීත්වය තුල නූතන උසස් දැනුම මුසු කෙරෙමින් ආරක්ෂාකාරී වූ වැඩ කරන පරිසරයක් නිර්මාණය  කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් භාවයක් ඇති කිරීමෙහිලා මෙම තොරතුරු සංග්‍රහය ඉමහත් පිටුවහලක් වනු ඇත.

පාරිසරික වශයෙන් හිතකාමී ආරක්ෂාකාරීව වැඩ කිරීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීමෙහිලා මෙය ඉදිරි පිම්මක් වනු නොඅනුමානය. අපගේ ත්‍රෛපාර්ෂවීය සහභාගීකරුවන් මෙහි උපරිම ඵල නෙලාගනු ඇතැයි අපේක්ෂා කරන අතර මෙම ප්‍රයත්නය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

වෛද්‍ය එන්. සී. අමරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය

## පටුන


**පරිච්ඡේදය 1** පිටුව

- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ තොරතුරු 05
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ දැක්ම, මෙහෙවර හා වටිනාකම් 05
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ පරිපාලන ව්‍යුහය 07

**පරිච්ඡේදය 2**

- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ පොදු අරමුණු 08

**පරිච්ඡේදය 3**

- ආයතනයේ වත්මන් තත්වය හා වර්ධනය
  - ආයතනික ස්ථායීතාව හා එහි වර්ධනය 10
- අපගේ පුහුණුව - ගුණාත්මක වර්ධනයන් 10 – 11
- ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සතිය සැමරීම 12
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සමුළුව 12
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා සහතිකපත් පිරිනැමීමේ උළෙල 13
- NOSH විශේෂතා සම්මාන - ප්‍රශස්ථ වෘත්තිකයන්ට සම්මාන හා ත්‍යාග ප්‍රදානය 14 – 15
- පාරිසරික සමීක්ෂණ / වෛද්‍ය පරීක්ෂණ 16 - 21
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 22
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 23
- කාර්මික අංශයේ සෙදියන් සඳහා වූ පුහුණු වැඩසටහන 23
- වැවිලි කර්මාන්ත අංශය සඳහා උසස් සහතික පත්‍ර පාඨමාලාව 24
- මූල්‍යමය තොරතුරු
- මූල්‍ය ප්‍රකාශය 25
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 27
- ගිණුම් පිළිබඳ සටහන් - ගිණුම් ප්‍රතිපත්ති 29
- විගණකාධිපති වාර්තාව 31 - 36

**<u>පරිච්ඡේදය 1</u>**

**වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ තොරතුරු**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය 2005 අප්‍රේල් 28 වැනි දින ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. එහෙත් කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ 2009 වර්ෂය තුලදී 2009 අංක 38 දරණ පනත මඟින් මීට ව්‍යවස්ථාපිත බලය ප්‍රදානය කරන ලදී. දැනුවත්භාවය ඉහල නැංවීම සහ විධිමත් සෞඛ්‍ය හා ආරක්ෂණ පියවර හරහා සියළුම දෙනාටම ආරක්ෂාකාරී වැඩකරන පරිසරයක් වැඩිදියුණුකොට පවත්වාගෙන යාම සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය කැපවී සිටී. අපගේ කාර්යභාර්ය වූ කලී දැනුවත්භාවය, පුහුණුව, වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳව පර්යේෂණ, යාවත්කාලීන තොරතුරු බෙදාහැරීම මෙන්ම උපදේශාත්මක සේවාවන් සැලසීම වේ. අප විසින් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සම්බන්ධයෙන්, සේවායෝජකයින්, සේවා නියුක්තිකයින් සහ සෙසු සියළු සේවක කොට්ඨාශ දැනුවත් කිරීම හා පුහුණු කිරීම කරනු ලැබේ.

**වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ අරමුණ :-**

ස්වයං මූල්‍ය සම්පාදන ආයතනයක් පිහිටුවා පවත්වා යාම සහ ජාත්‍යන්තර මට්ටමින් ආරක්ෂාකාරීවූ සහ සෞඛ්‍යයට හිතකර වැඩ පරිසරයක් මෙන්ම ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දෙන සංස්කෘතියක් බිහි කිරීම

**දැක්ම :-** ***“ සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම”***

**මෙහෙවර :-** ***“ සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියළු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛයිපාර්ශවීය කොටස් කරුවන් සවිබලගැන්වීම”***

**පගේ වටිනාකම්:**

| | |
|---|---|
| අදාලත්වය: | ආරක්ෂාකාරී සංස්කෘතියක් බිහිකිරීම වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ වගකීම වේ. |
| ගුණාත්මක භාවය | සේවාවන් ඉටුකිරීමෙහිලා අප විසින් ප්‍රශස්ත විද්‍යාත්මක පරිචය, ප්‍රශස්ත විද්‍යාත්මක දැනුම හා සම්පත් පමණක් භාවිත කරනු ලැබේ. අපගේ සේවාවන් ඉටුකිරීම සඳහා, අත්දැකීම්වලින් පිරිපුන් සුදුසුකම් ලත් විශේෂඥයින් යෙදවීම මගින් අපගේ සේවා සම්පාදනයේ ගුණාත්මක භාවය අප විසින් පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලාංකික කර්මාන්තයේ ඉදිරි අනාගතය වෙනුවෙන් ඉතා ඉහල ගුණාත්මක භාවයෙන් යුක්ත වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යමය සේවාවක් අප විසින් සලසනු ලැබේ. |
| හවුල්කාරත්වය | දේශීය කර්මාන්තය, සේවා යෝජකයින්, සේවා නියුක්තිකයින්, ජාත්‍යන්තර සංවිධාන, විශ්ව විද්‍යාල සහ වෘත්තීය ප්‍රජාව සමඟ ගෝලීය සංකල්ප අනුගමනය කරමින් ඔවුන් සමඟ හවුල්කාරත්වයෙන් බැඳෙමින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය නියෝජනය කරනු ලබන එකම රාජ්‍ය ආයතනය අප වේ. තවද, සේවායෝජකයින්, සේවානියුක්තිකයින් මෙන්ම සෙසු පාර්ශව කරුවන් සමඟ එක්වද අපගේ ත්‍රෛපාර්ශවීය හවුල්කරුවන් සමඟ අපගේ සම්බන්ධතා පවත්වා ගනිමින්ද කටයුතු කරමින් සිටිමු. |
| ප්‍රවේශය | උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට අපගේ වෙබ් අඩවිය හරහා වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ සේවාවන් පිළබඳ තොරතුරු ලබාගත හැකිය. |
| කාර්ය සාධනය | අපගේ වැඩසටහන් ප්‍රතිඵල පදනම් කරගත් ඒවා වේ. |
| වගවීම | ජාත්‍යන්තර හා ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව අපගේ වැඩසටහන් අගැයීමකට ලක් කෙරෙන අතර කර්මාන්තය තුල පැනනගින්නා වූ ඕනෑම ගැටළුවකට අප විසින් ප්‍රශස්ත විසඳුම් ලබාදෙනු ලැබේ. |
| අපක්ෂපාතී සේවාව | සාධාරණ හා අපක්ෂපාතී සේවාවක් අප විසින් පවත්වාගෙන යනු ලැබේ. |
| රහස්‍යභාවය | අපගේ පාරිභෝගිකයන්ගේ තොරතුරු වල රහස්‍යභාවය වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය විසින් සහතික කරනු ලැබේ. |
| ආරක්ෂාකාරී බව | ශ්‍රී ලංකාවේ වැඩකරන පරිසරය තුල ආරක්ෂාකාරී සංස්කෘතියක් බිහිකිරීම අපගේ වගකීමයි. |

## වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ පරිපාලන ව්‍යුහය

2009 අංක 38 දරණ පනත ප්‍රකාරව වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ තීරණ ගන්නා මණ්ඩලය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පිළිබඳව 2009 අංක 38 දරණ පනත මගින් නියමකොට දක්වා තිබේ. ඒ අනුව අමාත්‍යාංශ 14ක නියෝජිතයන් යුක්ත විය යුතු එම අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිත්වය දැරිය යුතු වන්නේ කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසිනි. දැනට පහත දැක්වෙන රජයේ අමාත්‍යාංශ නියෝජනය කරන නිලධාරීන්ද, සේවා යෝජකයින්ද සේවක වෘත්තීය සමිති වලින්ද එය සමන්විත වේ.

## □ධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පිළිබඳ තොරතුරු

### මණ්ඩලයේ සාමාජිකයින්

| | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | එස්. එම්. ජී. ජයරත්න මහතා | ලේකම්/සභාපති | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය |
| 02 | එම්. ඩී. සී. අමරතුංග මෙය | කම්කරු කොමසාරිස් ජනරාල් | කම්කරු අමාත්‍යාංශය (කාර්මික ආරක්ෂා අංශය) |
| 03 | මහාචාර්ය අජිත් ද අල්විස් මහතා | රසායන ඉංජිනේරු දෙපා | මොරටුව විශ්ව විද්‍යාලය |
| 04 | රෝහිත ප්‍රනාන්දු මහතා | කම්කරු කොමසාරිස් | කම්කරු ඉංජිනේරු අංශය |
| 05 | ජී. එම්. කේ. හෙට්ටිආරච්චි මහතා | අධ්‍යක්ෂ | මුදල් අමාත්‍යාංශය |
| 06 | එස්. ඒ. එස්. රුචිර විතාන මහතා | අධ්‍යක්ෂ | කාර්මික සංවර්ධන අමාත්‍යාංශය |
| 07 | වෛද්‍ය  ඩී. වී. ටී. විජේරත්න මයා | අධ්‍යක්ෂ | ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| 08 | වෛද්‍ය ඉනෝකා සුරවීර මෙය | ප්‍රජා වෛද්‍ය විශේෂඥ | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 09 | වෛද්‍ය එන්. සී. අමරසිංහ මෙය | අධ්‍යක්ෂ ජනරාල් | ජා. වෘ. සු. හා සෞඛ්‍ය ආයතනය |
| 10 | එච්. එන්. පී. හෙට්ටි කන්දගේ මහතා | | |

| | | | |
|---|---|---|---|
| 11 | ඩබ්. ඩී. පී. බී. වන්නිආරච්චි මහතා | | |
| 12 | ඩී. එම්. ජී. බී. දිසානායක මහතා | | |
| 13 | ඩබ්. ඒ. ඩී. වී. කුමාර වීරසිංහ මහතා | | |
| 14 | එච්. අයි. රූපසිංහ මහතා | | |
| 15 | ඩී. සී. එන්.කේ. දසනායක මහතා | | |
| 16 | ජී. බී. මල්ලවාරච්චි මහතා | | |

**පරිච්ඡේදය 2**

**වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ පොදු අරමුණු**

- සේවායෝජකයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ ආරක්ෂාව සහ ක්‍රියාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් සේවායෝජකයින් සහ සේවා නියුක්තිකයින් යන දෙපාර්ශවයේම සේවා පරිසරය සම්බන්ධයෙන් වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිලිබද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේදි රජයට උපදෙස් දීම.

- සේවා ස්ථානයන්හි ක්‍රියාවට අදාලව සිදුවන හදිසි අනතුරු සහ තුවාල වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිළිබඳව රජයට උපදෙස් දීම

- වෘත්තිය ආරක්ෂණ හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශණ, අධ්‍යාපන වැඩ සටහන්, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම කරගෙනයාම සහ ඒවාට සහය සැලසීම.

- උපකරණ, අනතුරුදායක ද්‍රව්‍ය, භෞතික, රසායන හෝ ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් යම් අනතුරුදායක දෑ නිවැරදිව භාවිතා කිරිම පිළිබඳව යම් ආයතනයකට හෝ පුද්ගලයෙකුට උපදේශන සේවා සැපයීම.

- වෙනත් යම් ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ හෝ පිටරටක විශ්වවිද්‍යාලයක් සමග සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍ය පිළිබඳව සහ දැනුම, පුහුණුව ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින සේවා නියුක්තිකයන්ට, නිවැසියන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තෙකුට දැනුවත් කිරීම හා අවශ්‍ය පුහුණුව ලබා දීම සහ

එකී පුහුණුව හෝ දැනුවත් කිරීමේ වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසුව සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම.

- උපකරණ, අනතුරුදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂපාදන හෝ වෙනත් යම් යම් අනතුරුදායක ද්‍රව්‍ය නිවැරදිව භාවිතාකරන ආකාරය හා හදුනාගත් අනතුරු වලින් වැලකීම පිළිබඳ අවශ්‍ය සේවාවන් සැපයීම.

- (i). වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ප්‍රමිතීන්, සංකේත, පරිචයන් හා මාර්ගෝපදේශ සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ කෙරෙන ව්‍යවස්ථාමය නියමයන් පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම.
- (ii). වැඩ පිළිබඳ සීමා කිරිමකට, තහනමකට, සීමා කිරීමකට හෝ අධීක්ෂණයකට යටත් කරනු ලැබිමකට නිරාවරණය වන්නාවූ ද්‍රව්‍ය සහ කාරක ඇගැයීම හා නිශ්චය කිරීම.

- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යයට අදාල වන තොරතුරු රැස්කිරීම, පිලියෙල කිරීම, බෙදාහැරීම සහ ප්‍රසිද්ධ කිරීමේ කටයුතු සිදුකිරීමට භාර ගැනීම සහ එයට සහයෝගය දැක්වීම.

- වෘත්තිය ආරක්ෂණය සහ සෞඛ්‍ය කටයුතුවලට සම්බන්ධ සාකච්ඡා, සමුළු, සම්මන්ත්‍රණ, වැඩමුළු, ලිපි, රචනා ඇතුලත් සාර සංග්‍රහ හෝ එවැනි සමාන වැඩසටහන් සංවිධානය කිරීම, පළ කිරිම හෝ ඊට දායකත්වය සැපයීම
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍ය ව්‍යාපෘති වැඩසටහන් හා ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය (coordination) කිරීම.

- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පරිචය ප්‍රවර්ධනය කිරීම හා පුළුල් කිරීම සඳහා පුස්තකාල හා විද්‍යාගාර පිහිටුවීම හා පවත්වාගෙනයාම.

- පර්යේෂණ හා විශේෂ රසායනාගාර වැඩිදියුණු කිරීම.

- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ජාතික සහ අන්තර්ජාතික ආයතන, විශ්ව විද්‍යාල, හෝ වෙනත් යම් යම් සංවිධාන සමග සම්බන්ධතා සහ ජාල පිහිටුවීම.

- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව ජාතික ප්‍රමිතියක් පියිටුවීම

## පරිච්ඡේදය 3

## ආයතනයේ වත්මන් තත්ත්වය හා වර්ධනය - ආයතනික ස්ථායිතාව හා එහි වර්ධනය

කර්මාන්තය වෙනුවෙන් සේවය සලසන ප්‍රධාන සේවා සම්පාදකයෙක් වශයෙන් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයට තම නාමය තහවුරු කර ගැනීමට හැකිව තිබේ.

## පගේ පුහුණුව - ගුණාත්මක වර්ධනයන්

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුම, පුහුණුව ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින සේවා නියුක්තිකයන්ට, නිවැසියන්ට, කම්කරුවන්ට හෝ වෙනත් යම් පුද්ගලයින් වෙනත් යම් ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් හෝ පිටරටක පිහිටි විශ්ව විද්‍යාලයක් සමඟ සහයෝගයෙන් හෝ මෙම ආයතනය මගින් දැනුවත් කිරීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම සහ එකී පුහුණුව හෝ දැනුවත් කිරීමේ වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසුව සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම.

පුහුණුව සහ දැනුවත් කිරීම හරහා කර්මාන්තය තුල සුරක්ෂිත සංස්කෘතියක් බිහිකිරීම සඳහා වූ මෙරට අවශ්‍යතාව සම්පූර්ණ කරනු පිණිස පහත සඳහන් කටයුතු ඉටු කරන ලදි. කණිෂ්ඨ නිලධාරී කණ්ඩායම් පුහුණු කිරීමේ අරමුණ ඇතිව 2014 වර්ෂයේදී කර්මාන්තකරුවන් අරභයා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පාඨමාලා සහතික පත්‍ර වැඩසටහන් තුනක් වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය විසින් පවත්වන ලදි. මෙම පාඨමාලා තුන සඳහා 80 දෙනෙක් සහභාගී වූහ. පාඨමාලාවන්හි කාලය දින 15 ක් විය. මෙම පාඨමාලාවන් තෘතියික වෘත්තීය සුදුසුකම් මට්ටම 4ට අනුරූප මට්ටමේ ඒවාය. සහභාගිකරුවන් 2014 ඔක්තෝම්බර් මස 14 දින පවත්වන ලද උත්සවයකදී ඊට අදාල සහතිකයක්/ඩිප්ලෝමා සහතික ලබාගැනිම.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය විසින් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවක මහතුන් සඳහා එක් දින පුහුණුවක් සංවිධානය කරන ලද අතර මෙය සඳහා සේවකයන් 110ට වැඩි සංඛ්‍යාවක් සහභාගි විය. ඔවුනට, අවුරුද්දක කාලයක් සඳහා වලංගු සුරක්ෂිතතාව පිළිබඳ බලපත්‍රයක් ලබාදෙන ලදි. මෙම පුහුණු කාලය තුලදී ප්‍රශස්ත සුරක්ෂිතතා පරිචය සම්බන්ධව පුහුණුව පමණක් නොව ඩෙංගු උණ පිළිබඳවත් එයින් වැලකීමේ ක්‍රම සහ විධි පිළිබඳවත් ඔවුන් දැනුවත් කරන ලදි.

ජ්‍යෙෂ්ඨ සුරක්ෂිතතා නිලධාරීන් සඳහා වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලා දෙකක් මීට සමගාමීව පවත්වන ලද අතර මෙම පාඨමාලාවේ කාලය එක් වසරක් විය. කාර්මික ක්ෂේත්‍රයේ නියුතු කම්කරුවන්ගේ පහසුව තකා එම පාඨමාලාව සාර්ථක ලෙස පැවැත්වීමට හැකිවූ අතර වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය විසින් ප්‍රධාන පාඨමාලා දෙකට කර්මාන්ත අංශයෙන් ඉහල පිළිගැනීමක් හිමිවිය. ඉහතදී සහභාගී වූවන් ජාත්‍යන්තර රැකියා වෙළඳපොලෙන් රැකියා ලබා ගැනීමට සුදුසුකම් ලැබූහ.

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය ජාතික වෘත්තීය නිපුණතා (NVQ) මට්ටම 4 සහතිකය සහ ඩිප්ලෝමා පාඨමාලා (මට්ටම 6) සහතිකය (පිළිගැනීමේ සහතිකය) ලබාගැනීමට සමත්විය.







වෙළඳපල ඉල්ලීම් මත පුද්ගල කණ්ඩායම් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආශ්‍රිත පුහුණු සැසි, ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වන ලදි.



## ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සතිය සැමරීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සතිය වනාහි අප වෙත ආයතන විසින් වාර්ෂිකව, අපගේ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් සංවිධානය කරනු ලබන එකකි. සේවායෝජකයන් හා සේවා නියුක්තිකයන් සියළු දෙනා එක්ව අත්දැකීම් බෙදාහදා ගැනීම මෙන්ම වෙනත් බොහෝ ක්‍රියාකාරකම්වල සහයෝගයෙන් නියැලීම සිදු කෙරේ. මෙය වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳව මෙරට සංවිධානය කෙරෙන විශාලතම සැමරුම් උත්සවය වේ. වසරක් වසරක් පාසා මෙම අවස්ථාව ජනතාවට ඉදිරිපත් කරන්නේ අභිමානයෙනි.

## 2014 ජාතික සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සමුළුවේ තේමාව




ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සමුළුවෙන් බිඳක්










2014 ජාතික ඩිප්ලෝමා ප්‍රදාන උත්සවයේ අවස්ථා









ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන ප්‍රදානය - ප්‍රශස්ත සේවා යෝජක ආයතන සඳහා සම්මාන සහ ත්‍යාග ප්‍රදාන

National Occupational Safety & Health Excellence Awards 2014








## ප්‍රශස්ථ ජයග්‍රාහිකයන්



කර්මාන්තය සංවර්ධනය කිරීම හා දැඩි අවදානම්, මධ්‍යම හා අඩු අවදානම් යනුවෙන් එය වර්ගීකරණය කොට වසර දෙකකට වරක් ඒ අනුව ජාතික සුරක්ෂිතතාව විශීෂ්ඨතා සම්මාන ප්‍රදානය කිරීම. ප්‍රශ්නාවලියක් සම්පාදනය කොට අයදුම්පත් සහ පිළිතුරු සැපයීම සඳහා මාර්ගෝපදේශ පොතක් සම්පාදනය කිරීමෙන් අනතුරුව මැයි මාසයේදී ජාතික සුරක්ෂිතතා විශිෂ්ඨ සම්මාන ප්‍රදාන සඳහා වූ තරඟය දියත් කරන ලදි. එය අදියර 3 කින් සැලසුම්කොට තිබිනි.

1. තහවුරු ලිපිලේඛණ සමඟ අයදුම්පත ඉදිරිපත් කිරීම.
2. ක්ෂෙත්‍රයේ සිටින වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිලිබඳ විශේෂඥ මණ්ඩලයක් විසින් අයදුම්පත් සමාලෝචනය කිරීම.
3. විශේෂයෙන්ම සැලසුම්කල මෘදුකාංගයක් භාවිතා කරමින්, විශේෂඥ මණ්ඩලයක් විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකිරීම.
4. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ප්‍රශස්ත නව නිර්මාණය තෝරාගැනීම පිණිස power point ඉදිරිපත් කිරීමක් මගින් තම තමන්ගේ අත්දැකීම් යොමුකරන ලෙස තෝරාගත් ප්‍රදර්ශකයන්ට අවස්ථාවක් දීම
5. සම්මාන ප්‍රදානෝත්සවය

ජාත්‍යන්තර කාර්මික වර්ගීකරණයන්ට අනුව කර්මාන්ත වර්ගකරන ලද අතර ප්‍රශස්ත ලෙස සේවකයින් වෙනුවෙන් වෘත්තිය සුරක්ෂිතතාවය තහවුරු කරනු ලැබූ සේවා යෝජකයින් තෝරාගෙන ඔවුන්ට සම්මාන සහ ප්‍රදානය කරන ලදි.

## පගේ පාරිසරික සමීක්ෂණ සේවාවන්

ශ්‍රී ලාංකික කර්මාන්ත සම්බන්ධයෙන් පාරිසරික අන්වේෂණ සේවාවන් සැලසීම පිණිස අති නවීන උපකරණ සතු එමෙන්ම සුදුසුකම්ලත් ආයතනයන්ගෙන් එකක් වන්නේ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ආයතනයයි. සේවායෝජකයින්ට තෘප්තිය නිරෝගීභාවය අත්කර දීම පිණිස කම්කරුන්ගේ වැඩකිරීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීමෙහිලා එය ප්‍රශස්ත ප්‍රවේශයක් වේ. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය විසින් පහත දැක්වෙන පාරිසරික අන්වේෂණ සේවාවන් සලසනු ලබයි.

**කර්මාන්තය තුල සිදුවන භෞතික නතුරු සමීක්ෂණය කිරීම.**

කර්මාන්තය තුල තිබෙන අධික ශබ්ද මට්ටමෙන් වැඩකරන ජනතාව ආරක්ෂා කර ගැනිම සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය විසින් ශබ්ද මට්ටම සමීක්ෂණය කොට අන්තර්ජාතික වශයෙන් පිළිගත් ශබ්ද මට්ටම් ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. කර්මාන්තය තුල ශබ්ද මට්ටම් මැන බැලීම සඳහා අප විසින් පහත දැක්වෙන උපකරණ භාවිතා කරනු ලැබේ.

## HD2110L – Class I integrating Sound level – Portable analyzer

HD2110Lයනු එහා මෙහා අතින් ගෙනයා හැකි ඉතා නිවැරදි ශබ්ද මට්ටම තුලනය කළ හැකි උපකරණයක් වන අතර Data logging spectrum සහ Statistical විශ්ලේෂණ පහසුකම් ඊට ඇත. මෙම උපකරණය නිෂ්පාදනය කොට ඇත්තේ කැපී පෙනෙන ශ්‍රව්‍ය තත්ත්වයන් ප්‍රශස්ත අයුරින් විශ්ලේෂණය කිරීම සඳහාය.

**<u>තාක්ෂණික රෙගුලාසි</u>**

1 පන්තියේ ශබ්ද මට්මම් සඳහා වූ මනුව නිෂ්පාදනය කරනු ලැබ තිබෙන්නේ IEC 61671-1 (එනම් 37035-OIC අනුකූලතා සහතිකය) සහ IEC 60804, 1 පංතියේ Octave සහ තුන්වැනි ඔක්ටේව් පෙරහන් (IEC 61260 අනුව) වලිනි.

IEC 61094-4 අනුව මයික්‍රෝෆෝන් නිෂ්පාදනය කොට තිබීම

**<u>භාවිතා කිරීම</u>**

ශබ්ද අවස්ථා ග්‍රහණය කිරීම සහ විශ්ලේෂණාත්මක කාර්ය පොදු තෙවැනි ඔක්ටේව් සංඛ්‍යාතයකදී වුවද ධ්වනි උපාංග හඳුනා ගැනීම, කාර්යබහුල වේලාවන්හිදී අනුරූපී ශබ්ද වක්‍ර හරහා ඡායාමාත්‍ර උපාංගයන් මගින් ඇසීම තක්සේරු කිරීම.

වැඩ පරිශ්‍රයන්හි මැන බැලීම් සහ පුද්ගලයින් ආරක්ෂාකිරීම සඳහා වූ උපකරණ (SNR, HML සහ OBM ක්‍රම)

ශබ්ද පරිවාරක සහ ආරක්ෂාකිරීම්

නිෂ්පාදන තත්ත්ව පාලක සහ යන්ත්‍රවලින් නිකුත්වන හඬ මැන බැලීම.

ගෘහ නිර්මාණාත්මක ශබ්දමය හා ගොඩනැගිලි මැන බැලීම්.









- උෂ්ණත්වය මැන බැලීම්

## <u>පගේ උපකරණ වල ප්‍රධාන ලක්ෂණ</u>

- මෙම උපකරණයේ ප්‍රධාන ලක්ෂණය වශයෙන් දැක්විය හැක්කේ ඊට QUWSTempoTM 44 Unit සමඟ 2" Style globe sensor එකක් තිබීමයි. මීට ප්‍රමිති උපාංග ඇත.
- කෙටි කාලීන හෝරා යන්ත්‍රය මගින් වේලාව සටහන් වූ නිවැරදි වාර්තා ලබාදෙයි.
- එමගින් වියළි බුබුළු, තෙත් බුබුළු හා ගෝලීය උෂ්ණත්වය WBGT ගෘහස්ථ/ එළිමහන් සාපේක්ෂ තෙතමනය සහ උෂ්ණත්ව index/Humidexමැනබැලීම/ගණනය කිරීම සිදුකෙරේ.

QUWSTempoTM 44 උෂ්ණත්වය ආතති අන්වේෂණ උපකරණය මගින් උසස් ප්‍රමිතියෙන් යුත් සේවාවක් ලබාදෙන අතර තෙත බුබුළු නඩත්තුව මෙන් කරදරකාරී නැත. මෙම මාදිලිය මගින් වියළි බුබුළු, තෙත බුබුළු සහ ගෝලීය උෂ්ණත්වය, ගෘහස්ථ WBGT, සාපේක්ෂක තෙතමනය සහ උෂ්ණත්ව දර්ශකය /ආර්ද්‍රතා දර්ශකය සමඟ මැන බැලීම/ගණනය කිරීම සිදුකෙරේ.

කෙටිකාලීන හෝරා යන්ත්‍රය මගින් වේලාව මුද්‍රිත නිවැරදි වාර්තා ලබාදෙයි. ග්‍රහණ කළමනාකරණ මෘදුකාංගය (DMS) ඇති on board data logging මගින් රූප සටහන්, රේඛා සටහන් හා වාර්තාකරණ විකල්ප (charting, graphing and reporting options) දත්ත විශ්ලේෂණය කිරීමට ඉඩ සැලසේ. ඇල්කයින් බැටරිය සහිත Questemp .44 (QT – 44) උපකරණයට පහත සඳහන් සම්මත උපාංග ඇතුලත් වේ.

i. Sensor Bar Assembly w/calculated wet bulb using Humidity sensor සහ 2” වර්ගයේ ගෝලීය ග්‍රාහකයක්



දූවිලි මැනීම



ඔබගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි දූවිලි මැන බැලීමේ උපකරණ අපගේ පුළුල් පරාසයට ඇතුලත් වේ. පාරිසරික මැනබැලීම්, කර්මාන්තශාලා සහ කාර්යාලවල දූවිලි කොටස් කොපමණ ප්‍රමාණයක් අඩංගුදැයි යන්න දැනගැනීම සඳහා මෙන්ම කම්කරුවන් ඒවාට කොතරම් ප්‍රමාණයක් දිනපතා නිරාවරණය වන්නේ දැයි යන්න දැනගැනීම සඳහා දූවිලි මැන බැලීමේ උපකරණ භාවිතා කෙරේ.

එවැනි දූවිලි මැන බැලීමේ උපකරණයක් කාර්මික පර්යේෂණ හා සංවර්ධන කාර්යාර්ථයන් මෙන්ම පිරිසිදු අවකාශ සඳහා භාවිතා කෙරේ.

දූවිලි අංශු ප්‍රමාණය මැන බැලීම සඳහා වූ Airy  නම්වූ නිෂ්පාදන පෙළ මගින් දූවිලි අංශු චූෂණය කිරීම මගින් වාතයේ අඩංගු දූවිලි ප්‍රමාණය මැන බැලීම සිදුකෙරේ.

දූවිලි මැනීමේ මෙම උපකරණය වත්මන් රෙගුලාසි සියල්ලම අනුගමනය කරමින් නිපදවා ඇති එකක් වන අතර ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය ඊට හිමිව තිබේ.

## කර්මාන්තයේ ගෘහස්ත- වායු තත්ත්ව □න්වේෂණය කිරීමේ □රමුණු

දැනට වැඩි වැඩියෙන් යොමුවෙමින් පවතින දෙයක් නම් සැප පහසු, ආරක්ෂාකාරී සහ සුවදායක ගෘහස්ත පරිසරයක් සලසාදීම පිළිබඳ කාරණයයි. හොඳ වායු තත්ත්වය සංකේන්ද්‍රණය හා ඵලදායිතාව ඉහල නැංවීමට තුඩුදේ.  නොපැමිණීම නිසා අහිමිවන දින ගණන එයින් අඩුවේ. TSI's Q – Track ™ගෘහස්ථ වායු තත්ත්ව අන්වේෂකය (7575) මගින් කඩිනම්ව හා නිවැරදිව සපයනු ලබන තොරතුරු මගින් ප්‍රධාන ගෘහස්ථ වායු තත්ත්ව පරාමිතිකයන් පිළිබඳව අගැයීමට හැකියාව ලැබේ.

## Kanomax Releases New IAQ Monitor Model 2212

2211 උපකරණයට අඩංගු සියලු ලක්ෂණ හා මැනීම් සමගවූ සියළු පරාමිතිකයන් 2212 සතුව තිබේ. එහෙත් 2212 උපකරණය නිෂ්පාදනය කල ඉංජිනේරුවන් විසින් එම යන්ත්‍රයේ ආර්ද්‍රතා කොටසේ තිබෙන ප්‍රතිචාරාත්මක වේලාව සඳහා වැඩිදියුණුකිරීම් සිදුකොට තිබේ.

නව සංවේදකය වඩාත් වේගවත් වන අතර තත්පර 15ක් වැනි කාලයකදී නිවැරදි ආර්ද්‍රතා මැනීම් නිකුත් කරයි.

කාබන්ඩයොක්සයිඩ් වායුව සහ කාබන් මොනොක්සයිඩ් වායුව පරිසරයේ කොතරම් ප්‍රමාණයක් අඩංගු දැයි ඉතා නිවැරදිව මෙයින් හඳුනාගැනීමට හැකියාව තිබෙන හෙයින් මීට සහතිකයක් හිමිව ඇත. උෂ්ණත්වය හා ආර්ද්‍රතාව ද එක්වරම මැණීමේ හැකියාවක් මීට ඇත.

- ගෘහස්ත වායුවේ ගුණාත්මක තත්ත්වන් අන්වේෂණය සඳහා CO, $CO_2$, උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාව ඒක්ෂණ පියවර හා Data log  බහුවිධ පරාමිතිකයන් ඇත.
- Dew (පිණි)  Point, වෙබ් බුබුළු උෂ්ණත්වය, පරම ආර්ද්‍රතාව, ආර්ද්‍රතා අනුපාතය සහ බාහිර වාතයේ ප්‍රතිශතය ගණනය කෙරේ.
- උපකරණය තුලම නිෂ්පාදිත (built in) මතකය තුල එය පාවිච්චි කරන්නාට බහුවිධ ස්ථාන මැනීම ගබඩා කිරීමට ඉඩ සලසයි. RS232C terminal එකකින් සමන්විතයි.

 

## <u>මෙම උපකරණයේ ලක්ෂණ සහ එය භාවිතා කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන</u>

- $CO_2$සහ CO උෂ්ණත්වය හා ආර්ද්‍රතාව මැනීම් එකම අවස්ථාවකදි ප්‍රදර්ශණය කරයි.
- Dew Point තෙත බුබුළු සහ බාහිර වාතයේ ප්‍රතිශතය ගණනය කරයි.
- විශාල රූප සටහන් ප්‍රදර්ශණ පුවරුව
    - මැනීම් 5 ක් දක්වා ඉදිරිපත් කරයි.
    - තිරයේම ප්‍රදර්ශනය කෙරෙන පණිවුඩ හා උපදෙස්
- VOC'S සහ සුළගේ වේගය ඇතුළු බහුවිධ පේණු විකල්ප සහිත එක උපකරණයක්
- එක මිනිත්තුවක් තුල ලොග් වීමකින් දින 29 ක දත්ත ගබඩා කිරීමට හැකි පහසුකම්වලින් යුක්ත වීම.

## <u>වැඩකිරීම සඳහා යෝග්‍යතාව ගැයීම</u>

කර්මාන්තය තුල වැඩෙහි නියැලීම සඳහා යෝග්‍යතාව සහතික කරනු වස් කම්කරුවන් වෙනුවෙන් විශේෂිත සේවාවක්, වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය විසින් සලසනු ලැබේ.

මෙය, සේවකයන්ගේ නිරෝගී බව සහතික කිරීමට මෙන්ම කර්මාන්තයේ ලාභදායිත්වයද ඉහල නැංවීමට තුඩුදෙන සාධකයකි.

පහත දැක්වෙන සේවා අප විසින් සම්පාදනය කරනු ලැබේ.

1. එක් එක් සේවකයා සුදුසුකම්පත් වෛද්‍යවරයකු විසින් පරීක්ෂාවට භාවිතා කෙරේ.
2. වෘත්තීය ඉතිහාසය ලබා ගැනේ.
3. ශරීර ස්කන්ද දර්ශකය ගණනය කරනු ලැබේ.
4. අනතුරුදායක ද්‍රව්‍ය වලට සහ රසායන ද්‍රව්‍යයන්ට නිරාවරණය වීම පරීක්ෂා කිරීම පිණිස රුධිර පරීක්ෂණ
5. පෙනහළු ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම
6. ශ්‍රවණ තත්ව පරීක්ෂාව

වෛද්‍ය පරීක්ෂණ සඳහා සහභාගී වූ සියළු සේවකයින්ට අප විසින් වෙන්වෙන්ව වාර්තා සපයන අතර එක් එක් සමාගමට ද වෛද්‍ය වාර්තා විශ්ලේෂණ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන්නෙමු.

**පෙනහළු ක්‍රියාකාරීත්වය පරීක්ෂා කරීම.**



**වෛද්‍ය පරීක්ෂණ**






## ප්‍රධාන පාඨමාලා සහ පුහුණු වැඩසටහන්

1. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
2. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
3. කාර්මික අංශයේ හෙද / හෙදියන් සඳහා පුහුණු වැඩසටහන්
4. වැවිලි අංශය සඳහා උසස් සහතික පත්‍ර පාඨමාලාව
5. පාරිසරික ආරක්ෂාව හා කසල කළමණාකරණ වැඩසටහන
6. ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වැඩමුළුව

- <u>වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව</u>

මෙම වර්ෂය තුලදී ද වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පවත්වන ලදී. 2014 මාර්තු මාසයේදී නව අයදුම්කරුවන් මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා ලදී. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් ඉහත පාඨමාලාවන්ට අදාළ සුදුසුකම් අනුව පිළිවෙලින්, විධායක නිලධාරීන් 44 ක්ද 32 වශයෙන් ඒවාට සහභාගී වූහ. තවද , සහභාගීත්වය පිළිබද ගත් කල එහි විශේෂ ලක්ෂණයක් වශයෙන් දැක්විය හැක්කේ සැප්තැම්බර් මාසයේදී පැවති මෙම පාඨමාලාව සඳහා සහභාගී වූ නිලධාරීන්ගෙන් බහුතරය ආරක්ෂක අංශයෙන් වීමය. මෙම පාඨමාලාව මගින් න්‍යායික හා ප්‍රායෝගික දැනුම අප විසින් ලබා දෙන අතර මෙම පාඨමාලාවේම කොටසක් වශයෙන් ශිෂ්‍ය කණ්ඩායම සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදී. ඒ අනුව සමාලෝචන වර්ෂයේදී ශිෂ්‍යන් සඳහා කොළඹ ඩොක් යාඩ් සහ සීදූව ලෝඩ් ස්ටාර් යන ස්ථාන වෙත පෙබරවාරි මාසයේදී ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කෙරිනි. ඔවුන් පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ අතර අනෙක් කණ්ඩායම ඊලඟ වර්ෂයේ අවසානය වන විට පාඨමාලාව අවසන් කිරීමට නියමිත අතර ඔවුන් විසින් තමන්ගේ වැඩ පරිශ්‍රයන් තුල වඩාත් සුරක්ෂිත

වාතාවරණයක් නිර්මාණය කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය කම්කරුවන්ගේ සුරක්ෂිතතාව කෙරෙහි ඉතා වැදගත් වනු ඇත.

විවිධ ක්ෂේත්‍ර සඳහා ප්‍රයෝජනවත් සේවාවක් සැලසීම පිණිස දායක වනු පිණිස වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් වශයෙන් කණ්ඩායමකට පෞද්ගලික පුහුණුවක් ලබා දීමට අප ආයතනය සමත් විය. අනෙක් අතට විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින තැනැත්තන් සම්බන්ධයෙන් ගත්කල එකී පුහුණුව අමතර සුදුසුකමක් වන හෙයින් එයින් වඩාත් ප්‍රතිඵල ලබාගත හැකිවන්නේය. මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඉක්බිතිව, විදේශ රටවල සේවය කරන පුද්ගලයින් බොහෝ ගණනකි.

- **<u>වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව</u>**

2014 වර්ෂයේදී වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පාඨමාලා දෙකක් පවත්වන ලදී. එක් එක් පාඨමාලාවේ කාලය සති 15ක් විය. මෙම පාඨමාලාවන්ගෙන් එකකට ශිෂ්‍යයන් 25ක් සහභාගී වූ අතර අනෙක් පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයන් 35 ක් සහභාගී විය. සියළු සහභාගීකරුවන් වැඩ පරිශ්‍රයන් තුල වෘත්තීය අනතුරු අවම වීම තුලින් ඔවුන් හැදෑරූ පාඨමාලාවන් ප්‍රතිඵලදායක වී ඇති බව විද්‍යාමාන විය. මොවුන්ගෙන් බහුතරයක් වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් (Safety officers ) වශයෙන් සේවයේ නියුක්ත වේ. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳව උනන්දුවක් දක්වන හා අධ්‍යාපන පොදුසහතික උසස් පෙළ සුදුසුකම් ඇත් ඕනෑම අයෙකුට මෙම පාඨමාලාව හැදෑරිය හැකිය.

- **<u>කර්මාන්ත ංශයේ හෙද / හෙදියන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව</u>**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය වූ කලී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනයකි. වැඩ කරන පන්තියේ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ස්ථාපනය කරන ලද මෙම ආයතනය ජනතාව අතර ජනප්‍රිය වෙමින් පවතී. එබැවින්, නිරතුරුවම කාර්මික අංශයේ රෝගීන් වෙනුවෙන් සත්කාරක සේවා සලසමින් වැදගත් මෙහෙයක් ඉටු කරන වෘත්තිකයින් සඳහා මෙන්ම නිශ්පාදන, ඇඟළුම් හා වැවිලි ක්ෂේත්‍ර යේ නියුතු අයවලුන් සඳහාද පාඨමාලාවක් ආරම්භ කළ යුතු බවට අප ආයතනය විසින් තීරණය කරන ලදී. පසුගිය අවුරුද්දේ දී මෙහි දෙවන කණ්ඩායම පාඨමාලාව සාර්ථකව හදාරා නිම කල අතර තුන් වැනි කණ්ඩායම 2014 දී බඳවා ගැනීමට කටයුතු කරන ලදී. මෙම පාඨමාලාව 2014 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර ඊට හෙද / හෙදියන් 06 ක් සහභාගී විය. සති 05 ක් පුරා මෙම පාඨමාලාව පැවති අතර එම කාලය තුල සහභාගීකරුවන් සියළු දෙනාම සාර්ථකව නිම කලහ.

2014 වර්ෂය තුලදී වැවිලි අංශයේ විධායක නිලධාරීන් 13 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පාඨමාලාව පවත්වන ලදී. මාස 03ක පුහුණු කාල සීමාවක් මීට අඩංගු වූ අතර මේ සඳහා ලියාපදිංචි වූවන් එකී කාල සීමාව ඇතුලත සාර්ථක අයුරින් පාඨමාලාව නිම කළහ. ප්‍රායෝගික හා න්‍යායික දැනුම ලැබෙන අයුරින් පාඨමාව සැලසුම්කොට තිබිනි. දෙදින ක්ෂේත්‍ර චාරිකාවක් මඟින් සහභාගීකරුවන් ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී. වැවිලි කර්මාන්ත ක්ෂේත්‍ර යේ නියුතු අයවලුන්ට එමඟින් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට හැකි වූ අතර ඵලදායී ආකාරයෙන් ඔවුන්ගේ කර්මාන්තශාලා පවත්වාගෙන යාමටද පිටුවහලක් ලබා දීමට ද හැකි විය. මෙම පුහුණුවෙන් ඉක්බිතිව සිදු කරන ලද පසු විපරම් අධ්‍යනයකදී මෙම තත්වය විය.

- <u>**වැවිලි ංශය සඳහා උසස් සහතික පත්‍ර පාඨමාලාව**</u>

වැවිලි අංශයේ සේවයේ නියුතු වූවන්ගේ වැඩකරන පරිසරය ක්‍රමවත් අයුරින් සංවිධානය කිරීම දිරිමත් කිරීමෙහිලා මෙම පාඨමාලාවෙන් ඉවහල් විය.

එපමණක් නොව "වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන්" යන නමින් තනතුරක් හඳුනාගනු ලැබීම මගින් ඊට වැඩි වටිනාකමටත් එකතු කරනු ලැබීය. මෙකී පියවර තුලින් විද්‍යාමාන තවත් ප්‍රගතියක් නම් සේවා යෝජකයින් හා සේවා නියුක්තිකයන් අතර ඵලදායී වර්ධනාත්මක ප්‍රවණතාවක් ඇතිවීමයි. මෙම පාඨමාලාව අවසන් කළ සහභාගීකරුවන්ගේ ප්‍රයෝජනය මාර්ගෝපදේශ අත්පොත් සම්පාදනය කරනු ලැබ ඇති අතර වැවිලි අංශයේ කර්මාන්තශාලා අතර එය බෙදා හැරීමට කටයුතු කරනු ලැබ තිබේ. තවද, පාඨමාලාව අවසානයේදී ප්‍රධානය කරනු ලබන සහතිකයට අමතරව ඔවුනට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) තත්ව සහතිකයට ලබා දීමට ද කටයුතු කරමින් තිබේ.

# මූල්‍ය ප්‍රකාශය

වැදගත් මූල්‍යමය කරුණු.

ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ආයතනයෙහි වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වන ආදායම සේවක මණ්ඩල වැටුප් සහ සියළු ආයතනික වියදම් සඳහා යොදා ගන්නා ආයතනයකි. ප්‍රධානම ආදායම් ප්‍රභවය වන්නේ පාරිසරික සමීක්ෂණ වන අතර තවද වෘත්තීය සුරක්ෂිතතා සහ පුහුණු වැඩසටහන්, වෘත්තීය සුරක්ෂිතතා උපදේශණ, පරීක්ෂා කිරීම් සේවා (Testing Service) වැනි රජයට හා පෞද්ගලික අංශයට දෙනු ලැබූ සේවාවන් මඟිනි. 2011 සිට පසුගිය වර්ෂ 3 තුලදී නොකඩවා ශුද්ධ ලාභයක් වාර්ථා වූ අතර පාරිසරික මිනුම් තුලින් සමාලෝචිත වර්ෂයේ ආදායම 2014 වර්ෂය තුල වැඩිම වාර්ථාගත අදායම විය. සමස්ථ මෙහෙයුම් ආදායම් රු. මිලියන 20 ක් වූ අතර එය 2013 වර්ෂයට සාපේක්ෂව 21.85% ක වර්ධන ප්‍රතිශතයකි.




ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ආයතනය මඟින් පවත්වන ලද සම්මන්ත්‍රණ, සම්මාන උළෙලවල් සඳහා පෞද්ගලික අංශය මගින් ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ආයතනය ලබාදෙන මූල්‍යමය හා තාක්ෂණික සහය එම උත්සව සාර්ථක කර ගැනිමට හා වියදම් අවම කර ගැනිමට හේතු විය.

**වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ වත්මන් මූල්‍ය තත්වය**




2014 වර්ෂයේදි ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පාරිසරික මිනුම් මගින් ලබා ඇති ආදායම රු. මිලියන 7.1 කි. මෙය වර්ෂයේ වැඩිම ආදායම් ප්‍රභවය ලෙස අනෙකුත් ආදායම් හි ලාභය සැලකීමේදි දැක්විය හැකිය. සමස්ථයක් වශයෙන් ඩිප්ලෝමා පාඨමාලාව සහ අනෙකුත් ගිවිසුම් මගින් ලබාගත් ආදායම් මාර්ගයන්හි සුළු අඩුවීමක් පෙන්වනු ලබයි.

ඒ වගේම සමස්ථ මූල්‍යමය ආදායම්හි පසුගිය වර්ෂයන්හි සැසදීමේදි ප්‍රගතියක් 2014 වර්ෂයේදි පෙන්නුම් කරනු ලබයි. ආයතනය විසින් 2014 වර්ෂයේදි උපයන ලද ශුද්ධ ආදායමෙහිද වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

**වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය**

2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය

| | | | |
|---|---|---|---|
| **වත්කම්** | | **2014 (රු)** | **2013(රු)** |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා සාමාන්‍යයන් | සටහන 1 | 3,042,876.75 | 1,136,807.76 |
| ලැබිය යුතු | සටහන 2 | 3,673,866.94 | 2,329,013.15 |
| සංවර්ධන අරමුදල | | 31,781,095.52 | 19,253,243.90 |
| | | 38,497,839.21 | 22,719,064.81 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර ගිණුම් | | 267,500.00 | 267,500.00 |
| පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | සටහන 3 | 17,610,593.52 | 13,881,852.94 |
| | | - | - |
| | | 17,878,093.52 | 14,149,352.94 |
| මුළු වත්කම් | | 56,375,932.73 | 36,868,417.75 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු | සටහන 5 | 3,641,442.14 | 1,481,439.04 |
| මුළු වගකීම් | | 3,641,442.14 | 1,481,439.04 |
| ශුද්ධ වත්කම් | | 52,734,490.59 | 35,386,978.71 |
| **ශුද්ධ වත්කම්** | | | |
| සමුච්චිත අතිරික්තය | සටහන 4 | 52,734,490.59 | 33,736,978.71 |
| | | - | 1,650,000.00 |
| | | 52,734,490.59 | 35,386,978.71 |

සහතික කරන ලද්දේ | පිලියෙල කරන ලද්දේ





හේරත් යාපා
සභාපති

පී.එම්.කේ.පෙරේරා
ස. අධ්‍යක්ෂ ( මුදල්)

**වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය**

**ආදායම් ප්‍රකාශය**
**(2014 දෙසැම්බර් 31 දිනට)**

| ආදායම | 2014 | 2013 |
|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන | 10,973,676.59 | 5,639,601.93 |
| මෙහෙයුම් ආදායම් | 20,383,184.53 | 16,726,943.53 |
| | 31,356,861.12 | 22,366,545.46 |
| **අඩු කළා** | | |
| **වියදම්** | | |
| පරිපාලන වියදම් | 9,901,151.84 | 8,344,790.46 |
| මූල්‍ය ගාස්තු | 19,690.00 | 300.00 |
| ක්ෂය වීම් | 1,994,242.33 | 1,299,406.08 |
| **මුළු වියදම්** | **11,915,084.17** | **9,644,496.54** |
| **වර්ෂය සඳහා අතිරික්තය** | **19,441,776.95** | **12,722,048.92** |

## ගිණුම්වලට දාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

### 1 . වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1.1** වාර්තා කරන ආයතනය

ශ්‍රී ලංකාවේ කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2005 අප්‍රේල් 28 වැනි දින ස්ථාපිත කරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, නිසි සෞඛ්‍ය හා ආරක්ෂිත පියවර පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට කැපවී සිටියි. මෙම ආයතනය කොළඹ - 05, ජාවත්ත පාරේ අංක 97 දරන ස්ථානයේ පිහිටා තිබේ.

**1.2** ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

යෝග්‍ය සෞඛ්‍ය සහ ආරක්ෂණ නීතිරීති පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී සිටියි. මෙම ක්‍රියාකාරකම්වලට යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු බෙදා හැරීම සහ උපදේශක හා උපදේශන සේවා ඇතුළත්වේ. මෙම ආයතනය මගින් සිදුකරනු ලබන පුහුණු කිරීම් තුළින් ප්‍රතිලාභ ලැබිය හැකි සේව්‍යයන්, සේවකයන් හා වෙනත් සියලුම ගණයන්හි ජනතාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙන්ම වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යයන, සමීක්ෂණ සහ පර්යේෂණ සඳහා ආයතනය සහයෝගය දක්වයි.

**1.3** පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශලවලට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) විසින් පනවා ඇති කුඩා ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ( SLASSE) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළකොට තිබේ.

(ආ) මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළකොට තිබේ. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නැත.

(ඇ) සක්‍රිය සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ආයතනික ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 2. දේපළ, පිරියත හා උපකරණ

i. හඳුනාගැනීම හා මැනීම

භාණ්ඩ විෂයයන් දේපළ, පිරියත හා උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම සහ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම්වලින් සිදුවන අලාභ පදනම් කරගෙනය. යන්ත්‍ර සූත්‍රයකට සහ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක පිරිවැයට ඇතුළත් වන්නේ එය මිලදී ගත් වටිනාකම සහ එය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එකී වත්කම ක්‍රියාකරවීමට ඍජුව දරන ලද පිරිවැයයි.
කිසියම් දේපළකට, යන්ත්‍ර සූත්‍රයකට හෝ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් වෙන වෙනම ගිණුම්ගතකොට තිබේ නම්, උපාංගය පිළිබඳව ඉදිරියට ගෙන යන කපාහළ වියදම්වලට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ඉන්ඉක්බිතිව කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ දේපළ, පිරියත හා උපකරණවලට අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එමගින් වැඩිවන්නේ නම් පමණි. සෙසු වියදම් දරනු ලැබූ පරිද්දෙන් වේ.

ii. ක්ෂයවීම්
වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලයට අනුව ඍජු රේඛා පදනමක් මත ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගැනේ.
ප්‍රවර්තන හා සංසන්දනාත්මක කාල සීමා සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජ්‍ය ආයුකාලයන් පහත දැක්වේ.

| | අවුරුදු |
|---|---|
| යන්ත්‍ර කට්ටල හා යන්ත්‍ර සූත්‍ර | 10 |
| පරිගණක උපකරණ | 5 |
| ලීබඩු සහ සවිකිරීම් | 10 |
| ශබ්ද පද්ධති අයිතම | 5 |
| වෛද්‍ය උපකරණ | 10 |
| වෙනත් වත්කම් | 10 |

මිලදී ගත් අවුරුද්ද තුළ ක්ෂයවීමක් සිදු නොකෙරෙන අතර අපහරණය කරන වර්ෂයේදී ඊට සම්පූර්ණ ක්ෂයවීමක් ඇතුළත් වේ.

iii. ස්ථාවර වත්කම්
ආයතනය ආරම්භ කිරීමේදී කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව විසින් වරින්වර ඊට මාරු කර එවන ලද සමහර වත්කම් ඇතුළත් වේ. 2012 වර්ෂයේදී වත්කම් සමහරක් ඉහත වර්ෂයේ ශේෂ පත්‍රයේ සීරුමාරු කිරීම් යටතේ ප්‍රාග්ධනීකරණයකොට ක්ෂයවීම් සිදුකරන ලදී.

iv. නව වෛද්‍ය උපකරණ මිලදී ගැනීම
ජාතික පදනම් ආයතනය විසින් නැනෝ තාක්ෂණික වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු. 16,50,000ක් වූ අතර එම මුදල ශේෂ පත්‍රයේ උපචිත වශයෙන් දක්වා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්/සී/එන්අයිඕඑස්එච්/එෆ්ජ්/2014
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 17 දින

සභාපති,

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

**ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2015 ජුනි 18 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 වැනි දිනට ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් සහ වගකීම්ද ආදායම් හා වියදම්ද විශේෂිත අවස්ථාවකදී හැරුණු විට හිලව් කළ නොහැකි වුවත් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු. 36,220,884 ක් වූ ආදායමෙන් රු.14,694,860 ක් වූ වියදම් හිලව් කර ශුද්ධ ශේෂය රු. 20,383,184 ක් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

(ආ) එක් එක් ආදායම් ප්‍රභවය ප්‍රමාණාත්මක වන විට මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව හෙළිදරව් කළ යුතු වුවත් උසස් සහතිකපත්‍ර පාඨමාලාවෙන් ලද රු.1,229,401 ක ආදායම කාර්මික පාඨමාලා ආදායමෙහිද, වෛද්‍ය පරීක්ෂණ වෙනුවෙන් ලද රු.1,424,000 ක ආදායම සහ ජාතික වෘත්තීය කුසලතා පාඨමාලා ප්‍රමිති වැඩසටහන් සඳහා රු.1,474,533 ක ආදායම් වෙනත් ගිවිසුම්ගත කාර්යභාර වලින් ලද ආදායමෙහිද දක්වා තිබුණි.

(ඇ) ආයතනය විසින් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා 2010 වර්ෂයේ සිට ලැබුණ රු.16,151,975 ක මුදලක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කර ගත යුතු ආයතනය විසින් දරන ලද රු.3,115,432 ක් වූ ප්‍රාග්ධන වියදම් සහ රු.2,387,532 ක් වූ පුනරාවර්තන වියදම් ලැබිය යුතු මුදලක් වශයෙන් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු. 5,813,827 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම රු.3,728,741 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගෙන තිබූ අතර රු.10,000 ක් වූ සුළු මුදල් ශේෂය අත්හැරී තිබුණි. එහෙයින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

## 2.3 නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 18 වගන්තිය | ආයතනය විසින් ආයතනයේ වැඩකටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කර අදාල වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත් වීමට පෙරාතුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2013 වර්ෂය සඳහා වූ එම වාර්තාව විගණන දිනය දක්වාම සකස් කර නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | ආයතනයේ අතිරික්ත මුදල්, මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ආයෝජනය කර ආදායම් ඉපැයීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ මුදල් හා බැංකු ශේෂය රු.3,032,877 ක් විය. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------------

ආයතනය විසින් දිරි දීමනා ගෙවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලය වෙත රු. 397,602 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ජාතික වෘත්තිය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,441,777 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු. 12,722,049 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,719,728 ක ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. අතිරික්තය වැඩිවීම කෙරෙහි රජයේ දායකය රු. 8,990,316 කින් හා මෙහෙයුම් ආදායම රු. 2,270,588 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවීම සඳහා පාදක කර ගත යුතු 2011 අප්‍රේල් 29 දිනැති අංක PED 58 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.2 ඡේදයට අනුව මෙම ආයතනය අදාල වර්ගීකරණය තුලට ඇතුලත් කර නොතිබුණි. එසේ තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවීමට අදාල විධිවිධාන පැහැදිලි කරගෙන නොතිබුණි.

(ආ) දැනට ආයතනය පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීම හෝ කුළී ගෙවීම පිළිබඳව අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට ද එළැඹ නොතිබුණි.

(ඇ) ආයතනය විසින් සහතික පත්‍ර පාඨමාලා 03ක් පවත්වා සහතික පත්‍ර ප්‍රදානය කරන නමුත් එම පාඨමාලාවන් අයදුම් කළ සහ සාර්ථක ලෙස නිමකර සහතික පත්‍ර හිමිකරගත් අයගේ විස්තර ඇතුලත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. මේ නිසා පාඨමාලාවන් නිමකර සහතික පත්‍ර හිමිකරගත් අයගේ සහතික පත්‍ර තහවුරු කිරීම් ගැටළුකාරී වී තිබුණි.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ධූර කාලය 2015 මාර්තු 21 දින අවසන් වන නමුත් එම සාමාජිකයන් 2014 නොවැම්බර් 25 දිනෙන් පසුව පාලන සභා රැස්වීම්වලට සහභාගී වී නොතිබුණි.

**4.2 කාර්යමණ්ඩල පරිපාලනය**

---------------------------

ආයතනයේ අනුමත කාර්යමණ්ඩල හා පුරප්පාඩු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 13 ක අනුමත සේවක සංඛ්‍යාව 25 ක් වූ අතර දැනට සිටින සේවක සංඛ්‍යාව 15 කි. මේ අනුව පවතින පුරප්පාඩු 10 විගණන දිනය දක්වාම පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් පසුගිය වර්ෂවලදීද විගණනයෙන් පෙන්වා දී තිබූ අතර ආයතනයේ ඇතැම් අංශවල කටයුතු මෙම පුරප්පාඩු නොපිරවීම නිසා අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. අත්‍යාවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම තුලින් ආයතනයේ අරමුණු නිසි පරිදි ඉටුකරගැනීමේ දුෂ්කරතාවයන් සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මඟින් භෞතික ඉලක්ක පමණක් ඇතුලත් කර තිබූ අතර මූල්‍ය ඉලක්ක ලබා දී නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

---

ආයතනයේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විචලනය සියයට 31 සිට සියයට 515 දක්වා වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය ලේඛනමය පාලනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)